# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,422 - 2025 ජනවාරි මස 31 වැනි සිකුරාදා - 2025.01.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස : II (ආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 152 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 154 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... | 164 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 පෙබරවාරි මස 21 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 පෙබරවාරි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම් හා පශු සම්පත් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මිල ගණන් කැඳවීමයි

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2025**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2025.02.14 දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. එදිනම ප.ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාරගන්නා ස්ථානය* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| උතුරු මැද පළාත | අනුරාධපුර | අනුරාධපුර - 2 | පළාත් සර්වේයර් ජනරාල් (උතුරු මැද පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, අනුරාධපුර | අනුරාධපුර අවට නගර | 2025.03.01 |
| බස්නාහිර පළාත | කළුතර | හොරණ | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කොළඹ 05 | හොරණ අවට නගර | 2025.03.17 |
| බස්නාහිර පළාත | කළුතර | පැලවත්ත | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කොළඹ 05 | පැලවත්ත අවට නගර | 2025.03.21 |
| බස්නාහිර පළාත | ගම්පහ | මහර | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කොළඹ 05 | වැලිවේරිය හා දෙල්ගොඩ අවට නගර | 2025.05.01 |
| නැගෙනහිර පළාත | අම්පාර | අක්කරපත්තුව | පළාත් සර්වේයර් ජනරාල් (නැගෙනහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ත්‍රිකුණාමලය | අක්කරපත්තුව අවට නගර | 2025.04.01 |
| නැගෙනහිර පළාත | අම්පාර | සම්මන්තුර | පළාත් සර්වේයර් ජනරාල් (නැගෙනහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ත්‍රිකුණාමලය | සම්මන්තුර අවට නගර | 2025.04.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතුය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතුය. ජල හා විදුලි මීටර් වෙන වෙනම තිබිය යුතුය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්ත ශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතුය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතුය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතුය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් තිබිය යුතු අතර, නිලධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර හෝ ඉඩ පහසුකම් ද තිබිය

යුතුය. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 2500 පමණ හෝ ඊට වැඩි විය හැක.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම්පත්‍ර, **සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද සහිතව**, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුළියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2025.02.14 දින පස්වරු 02.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

වයි. ජී. ඥානතිලක,
සර්වේයර් ජනරාල්, (රා.ආ.).

2025 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ 05, බර්නාඩ් සොයිසා මාවත,
අංක 150, සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුළියට ගැනීම - 2025**
**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2025**

*ගොඩනැගිලි අයිතිකරුගේ*

1. සම්පූර්ණ නම -
2. ලිපිනය -
3. දුරකථන අංකය -
4. ජාතික හැඳුනුම්පත් අංකය -

*ගොඩනැගිල්ල*

1. කුළියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද?
2. මාසික කුළී මුදල -
3. පිහිටි ස්ථානයේ ලිපිනය -
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි.මී.
5. භූමියේ විශාලත්වය -
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර -
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද?
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද ?
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/ ........) -
10. නවතා තැබීමට හැකි වාහන ගණන -
11. රැහැන් දුරකථන සබඳතා තිබේ ද ?

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මා විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

...........................................
අයදුම්කරුගේ අත්සන.

01 - 765

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - කුලියාපිටිය**

කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පැවති නඩුවලට අදාළව රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද පහත ලේඛනයේ සඳහන් භාණ්ඩ 2025.02.15 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ.ව. 9.45 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව. 8.30 සිට 9.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින්ම පමණක් ගෙවීම් කළ යුතුය.

එම්. ඩී. රන්දික ලක්මාල් ජයලත්,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කුලියාපිටිය.

2025 ජනවාරි මස 17 වැනි දින,
කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව
මහෙස්ත්‍රාත් අධිකරණය - කුලියාපිටිය - 2025

| *අනු අංකය* | *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01 | ලොකු ප්ලාස්ටික් බූලි | 50 |
| 02 | කුඩා ප්ලාස්ටික් බූලි | 100 |
| 03 | ලෙලි පොල් තොගය | 400 පමණ |
| 04 | වීදුරු බෝතල් තොගය | 1500 පමණ |
| 05 | වට 3 කරාම රහිත ගෑස් ලිප් | 02 |
| 06 | වට 4 කරාම රහිත ගෑස් ලිප් | 01 |
| 07 | වට 3 කරාම සහිත ගෑස් ලිප් | 02 |
| 08 | වට 4 කරාම සහිත ගෑස් ලිප් | 01 |
| 09 | වට 4 කරාම සහිත ගෑස් ලිප් | 01 |
| 10 | වට 3 කරාම සහිත ගෑස් ලිප් | 01 |
| 11 | වට 3 කරාම සහිත ගෑස් ලිප් | 01 |
| 12 | ලිට්‍රෝ 12.5 Kg ගෑස් සිලින්ඩර් | 01 |

| *අනු අංකය* | *භාණ්ඩය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 13 | ලිට්‍රෝ 12.5 Kg ගෑස් සිලින්ඩර් | 01 |
| 14 | ලාෆ් 12.5 Kg ගෑස් සිලින්ඩර් | 01 |
| 15 | ලාෆ් 12.5 Kg ගෑස් සිලින්ඩර් | |
| 16 | ඇළුමිනියම් කළගෙඩි | 01 |
| 17 | ඇළුමිනියම් ලොකු මුට්ටි | 01 |
| 18 | ඇළුමිනියම් පොඩි මුට්ටි | 01 |
| 19 | ලොකු ප්ලාස්ටික් බැරල් | 02 |
| 20 | යකඩ සවල් | 03 |
| 21 | යකඩ සවල් | 03 |
| 22 | යකඩ සවල් | 03 |
| 23 | යකඩ බාල්දි | 03 |
| 24 | යකඩ බාල්දි | 03 |
| 25 | කෙවිල්ටර් වර්ගයේ 3 gang ස්විච් | 02 |
| 26 | කෙවිල්ටන් වර්ගයේ 2 gang ස්විච් | 01 |
| 27 | ඔරේන්ජ් වර්ගයේ 1 gang ස්විච් | 01 |
| 28 | අංක BAI - 3771 දරන බජාජ් CT100 වර්ගයේ යතුරුපැදි | 01 |
| 29 | අංක BGD - 9091 දරන හොන්ඩා Dio වර්ගයේ යතුරුපැදි | 01 |
| 30 | අංක LL - 1487 දරන කැන්ටර් ලොරි රථ | 01 |

01-739

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - සියඹලාණ්ඩුව**

සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ **2025.02.15 වැනි සෙනසුරාදා දින පෙ.ව. 10.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි වෙන්දේසිය පිළිබඳ දැන්වීම් 2025.01.31 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත යවා ඇත.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවලෙහිම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.

අනුරුද්ධ සමරවීර,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - සියඹලාණ්ඩුව.

2025 ජනවාරි මස 23 වැනි දින,
සියඹලාණ්ඩුව මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

උපලේඛනය

වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ ලැයිස්තුව

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | 21880<br>(BR 611/24) | TYPE ARI - 10512 හා අංක 8327865 දරන ඔකීටා G3500K විදුලි ජනක යන්ත්‍ර 01 යි |
| 02 | 21880<br>(BR 611/24) | දිග අඩි 62 අඟල් 06 ක් වන අලු පැහැති වයර් 01 යි |
| 03 | 21880<br>(BR 611/24) | ලී මිට සහිත උදලු 01 යි |
| 04 | AR 722/24 | පා පැදි 01 යි |
| 05 | 21832 | ගෑස් සිලින්ඩරය |
| 06 | 21832 | රෙගියුලේටරය හා කුඩා ප්‍රමාණයේ ගෑස් ලිප |
| 07 | AR 42/25 | ගෑස් ලිප - රෙගියුලේටර 01 යි |
| 08 | AR 42/25 | සිලින්ඩරය |
| 09 | 20768 | අත් පොරෝ 01 යි |
| 10 | 20643 | ලොකු පොරෝ 01 යි |
| 11 | 20873 | සවල් 01 යි |
| 12 | 20772 | උදලු 01 යි |
| 13 | 21791 | ලොකු ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 14 | 20929 | ඇලුමිනියම් පොඩි මුට්ටි 01 යි |
| 15 | 21543 | ඇලුමිනියම් කළ 01 යි |
| 16 | 21822 | ඇලුමිනියම් කළ 01 යි |
| 17 | 21832 | ඇලුමිනියම් කළ 01 යි - ප්ලාස්ටික් බේසම 01 යි |
| 18 | 21123 | කැති 01 යි |
| 19 | 20760 | කැති 01 යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 20 | 21500 | කොළ පාට කැප් 01 යි, ලොකු කුඩ 01 යි |
| 21 | 21799 | අඬු සහිත බූලි 01 යි |
| 22 | 21801 | අඬු සහිත බූලි 01 යි |
| 23 | 21696 | බූලි 01 යි |
| 24 | 21746 | බූලි 01 යි |
| 25 | 21824 | බූලි 01 යි |
| 26 | 21802 | කෑන් 01 යි |
| 27 | 21143 | කෑන් 01 යි |
| 28 | 21544 | කෑන් 01 යි |
| 29 | 21286 | කෑන් 01 යි |
| 30 | 21482 | කෑන් 01 යි |
| 31 | 21090 | කෑන් 01 යි |
| 32 | 21497 | කෑන් 01 යි |
| 33 | AR 868/24 | කෑන් 01 යි |
| 34 | 21780 | කෑන් 01 යි |
| 35 | 18702 | කෑන් 01 යි |
| 36 | 20453 | කෑන් 01 යි |
| 37 | 21089 | කෑන් 01 යි |
| 38 | 21191 | කෑන් 01 යි |
| 39 | 21192 | කෑන් 01 යි |
| 40 | 21373 | කෑන් 01 යි |
| 41 | 21832 | කෑන් 01 යි |
| 42 | 21716 | කෑන් 01 යි |
| 43 | 21381 | කෑන් 01 යි |
| 44 | 21660 | කෑන් 01 යි |
| 45 | 21382 | කෑන් 01 යි |
| 46 | 21311 | කෑන් 01 යි |
| 47 | 21274 | කෑන් 01 යි |
| 48 | 21811 | කෑන් 01 යි |
| 49 | 21413 | කෑන් 01 යි |
| 50 | 20458 | කෑන් 01 යි |
| 51 | 21483 | කෑන් 01 යි |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 52 | 21796 | අඬු සහිත බූලි 01 යි |
| 53 | 19575 | කෑන් 01 යි |
| 54 | 21814 | යකඩ බැරල් 01 යි |
| 55 | 21356 | යකඩ බැරල් 01 යි |
| 56 | 21598 | යකඩ බැරල් 01 යි |
| 57 | AR 42/25 | යකඩ බැරල් 01 යි |
| 58 | AR 42/25 | යකඩ බැරල් 01 යි |
| 59 | AR 602/24 | යකඩ බැරල් 01 යි |
| 60 | AR 640/24 | යකඩ බැරල් 01 යි |
| 61 | AR 601/24 | ප්ලාස්ටික් බැරල් 01 යි |
| 62 | 21143 | ප්ලාස්ටික් බැරල් 01 යි |
| 63 | 21197 | කුඩා ප්ලාස්ටික් බැරල් 01 යි |
| 64 | 21742 | ඇලුමිනියම් මුට්ටි 01 යි (ලොකු) |
| 65 | 21585 | ඇලුමිනියම් මුට්ටි 01 යි (ලොකු) |
| 66 | 21585 | ඇලුමිනියම් තාච්චි 01 යි (ලොකු) |
| 67 | 17414<br>(BR 270/23) | HUGO වර්ගයේ මැෂිමට අඩි 01 ක් පමණ දිග අගල් 04 ක විශ්කම්භයෙන් යුත් තලය සහිත බම්බු කටර් 01 යි |
| 68 | 17414<br>(BR 270/23) | ලේබල් ගලවන ලද අළුපාට හා කොළ පාට ගල් විදින මැෂිම |
| 69 | 17414<br>(BR 270/23) | අඩි 01 යි අඟල් 03 ක් දිග යකඩ පැතලි කටු 01 යි |
| 70 | 17414<br>(BR 270/23) | අඩි 01 යි අඟල් 07 ක් දිග යකඩ පැනල් කටු 01 යි |
| 71 | | නීති විරෝධී මත්පැන් විනාශ කිරීමෙන් පසු හිස් වූ විවිධ ප්‍රමාණයේ හා විවිධ වර්ගයේ බෝතල් තොගයක් |

01 - 750

---

**ශ්‍රී ලංකා පොලීසිය - මිරිහාන පොලිස් සංදේශ කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මිරිහාන පොලිස් සංදේශ කොට්ඨාසයේ භාවිතයට ගත නොහැකි භාණ්ඩ 2025.02.20 වැනි දින පෙ.ව. 10.30 ට මිරිහාන පොලිස් සංදේශ කොට්ඨාස භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ 2025.02.20 වැනි දිනම පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා පරික්ෂා කළ හැකිය.

ඇතුල්වීමේ ගාස්තුව වශයෙන් රු. 250.00 ක මුදලක් අය කරනු ලබන අතර, එම මුදල ආපසු ගෙවනු නොලැබේ.

වෙන්දේසිය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ සඳහා උපරිම ලංසුව ඉදිරිපත් කරනු ලබන ලංසුකරු වෙත අදාළ භාණ්ඩ ලබා දීමට වෙන්දේසි මණ්ඩලය තීරණය කරනු ලැබීමෙන් පසුව එම අවස්ථාවේදීම මුදලින් ගෙවීම් කටයුතු සිදු කළ යුතු අතර චෙක්පත් මගින් ගෙවීම් කටයුතු සිදු කළ නොහැකි බව ද දන්වමි.

වෙන්දේසිය අවසන් වීමෙන් පසු වෙන්දේසියේ උපරිම ලංසුව තැබූ ලංසුකරු විසින් උපරිම ලංසුවේ සඳහන් මුදලින් 20% ක මුදලක් එම අවස්ථාවේදීම ගෙවීම් කල යුතු අතර පැය 1400 ට පෙර මුළු මුදලම තැන්පත් කළ යුතුය. එසේ නොවුනහොත් මූලිකව තැන්පත් කළ 20% මූලික තැන්පත් මුදල රාජසන්තක කිරීමට කටයුතු කරන බවද දන්වමි.

වෙන්දේසියේ විකුණනු ලබන සියලු භාණ්ඩ 2025.02.20 වැනි දින ප.ව. 18.00 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, විකුණනු ලබන භාණ්ඩ නැවත විකිණීම හෝ වෙන්දේසි කිරීම වෙන්දේසි භූමිය තුළ දී සිදු කළ නොහැකි බව ද දන්වමි. වෙන්දේසිය සඳහා සහභාගී වන සියලු ගැණුම්කරුවන් සඳහා ආසන පහසුකම් ලබා දෙන අතර වෙන්දේසිය පැවැත්වෙන අවස්ථාවේ දී සියලු ගැණුම්කරුවන් එම අසුන්වල අසුන්ගතව සිටිය යුතු බව ද දන්වමි.

වෙන්දේසියෙන් අලෙවි කළ භාණ්ඩ ලබා දීම සිදු කරනු ලබන්නේ මුදල් ගෙවා ලබා ගන්නා රිසිට්පතේ නම සඳහන් පුද්ගලයන්ට පමණි.

ගැණුම්කරු විසින් තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසි භූමියට ඇතුළු විය හැක්කේ ගැණුම්කරු සමග ඔහුගේ එක් නියෝජිතයෙකුට පමණි.

භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් පසු එම භාණ්ඩ රැගෙන ගිය පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් ශ්‍රී ලංකා පොලීසිය මගින් දරනු නොලබන බව ද දන්වමි.

කේ. කේ. කිංස්ලි ගුණසේකර,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
අධ්‍යක්ෂ.

පොලිස් සංදේශ කොට්ඨාසය,
මිරිහාන පාර, නුගේගොඩ.

**උපලේඛනය**

| *අනු. අංකය* | *භාණ්ඩයේ නම/විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01 | බැටරි 12 වෝල්ට් 70 ඇම්ප් | 641 |
| 02 | බැටරි 12 වෝල්ට් 100 ඇම්ප් | 183 |
| 03 | බැටරි 12 වෝල්ට් 200 ඇම්ප් | 11 |
| 04 | බැටරි 12 වෝල්ට් 120 ඇම්ප් | 04 |
| 05 | බැටරි 12 වෝල්ට් 90 ඇම්ප් | 20 |
| 06 | බැටරි 12 වෝල්ට් 65 ඇම්ප් | 50 |
| 07 | බැටරි 12 වෝල්ට් 45 ඇම්ප් | 10 |
| 08 | බැටරි බැන්ක් සේල් | 18 |

01 - 777

**මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිසර**

අධිකරණයට ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වැලිසර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන ලද මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති නඩු භාණ්ඩ **2025.02.22 වැනි දින පෙ.ව. 10.00** ට වැලිසර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් පාන්නෙකු වේ නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

2. වෙන්දේසිය ආරම්භ වීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ එදින පෙ.ව. 9.30 සිට 10.00 දක්වා කාලය තුළ දී පරීක්ෂා කර බැලිය හැකිය.

3. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී, අධිකරණයේ අභිමතය පරිදි භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය මෙම අධිකරණය සතුය.

4. වෙන්දේසියේ මිල දී ගන්නා සියලුම භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම, මුදලින් ගෙවීම කළ යුතු අතර චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාර ගනු නොලැබේ.

5. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේදීම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

6. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කිරීම අනිවාර්ය වේ.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිසර.

2025 ජනවාරි මස 24 වැනි දින,
වැලිසර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය 01**

| *අනු අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *වාහන වර්ගය* |
|---|---|---|---|
| 01 | B 2038/18 | CP QE 3599 | ත්‍රිරෝද රථය |
| 02 | B 1153/19 | WP HN 6630 | ත්‍රිරෝද රථය |
| 03 | 48298/20<br>(B 1141/20) | WP BGP 6172 | යතුරු පැදිය |
| 04 | 49280/20 | WP AAQ 0488 | ත්‍රිරෝද රථය |
| 05 | 54945/21 | CP AAT 5310 | ත්‍රිරෝද රථය |
| 06 | 63047/22 | WP AAY 0529 | ත්‍රිරෝද රථය |
| 07 | 63226/22<br>(B 2737/20) | WP AAS 7214 | ත්‍රිරෝද රථය |
| 08 | 72408/22<br>(B 271/21) | WP BHS 5992 | යතුරු පැදිය |

| අනු අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|---|
| 09 | 57222/21 | BHX 5917 | යතුරු පැදිය |
| 10 | 50565/20<br>(B 4218/8/13) | 32 - 9572 | ජීප් රථය |
| 11 | AR 2568/22 | 202 - 8238 | රතු පැහැති ත්‍රිරෝද රථය |
| 12 | AR 2316/23 | WP WC 8767 | නිල් පැහැති ඩිස්කවරි යතුරු පැදිය |
| 13 | AR 804/23 | WP TD 7735 | ඩිස්කවරි යතුරු පැදිය |
| 14 | AR 3217/22 | WP BDH 8734 | යතුරු පැදිය |
| 15 | AR 2564/22 | SP QG 1212 | ත්‍රිරෝද රථයක් |
| 16 | AR 2566/22 | JS 3828 | යතුරු පැදිය |
| 17 | AR 2565/22 | JG 5066 | යතුරු පැදිය |
| 18 | AR 169/22 | BIO 0312 | යතුරු පැදිය |
| 19 | AR 1042/21 | TT 8616 | යතුරු පැදිය |
| 20 | AR 2319/23 | NW PV 7152 | ප්ලැටිනා වර්ගයේ යතුරු පැදිය |
| 21 | AR 2487/23 | WP TN 3156 | ප්ලැටිනා වර්ගයේ යතුරු පැදිය |
| 22 | AR 2488/23 | UP 7469 | CT 100 වර්ගයේ යතුරු පැදිය |
| 23 | AR 2317/23 | චැසි අංක එන්ජින් අංක වෙනස් කර ඇත | CT 100 වර්ගයේ යතුරු පැදිය |
| 24 | AR 2568/22 | 202-8238 | රතු පැහැති ත්‍රිරෝද රථය |
| 25 | 77730/23 | BDQ 7306 | යතුරු පැදිය |
| 26 | 93546/24 | ABQ 9005 | ත්‍රිරෝද රථය |
| 27 | 86280/23<br>B 3399/22 | CAV 2721 | කාර් රථය |

**උපලේඛනය 02**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01 | 56786/21 | 1. කුඩා ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 02 | 59456 | 1. ගෑස් සිලින්ඩර් 01<br>2. 5kg ගෑස් සිලින්ඩර් 01<br>3. කරාම හතරකින් යුත් රෙගියුලේටරය සවි කරන ලද ගෑස් ලිප් එකයි |
| 03 | 71785/22 | වට දෙකකින් යුත් ගෑස් ලිප් 01 |
| 04 | 85555/23 | 1. 12.5kg නිල් පාට ගෑස් සිලින්ඩර් 02<br>2. ගෑස් ලිප් 02 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 05 | AR 2483/23 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 06 | AR 2485/23 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 02<br>මයික්‍රෝ වර්ගයේ ජංගම දුරකථන 01 |
| 07 | AR 3873/23 | එස්ලෝන් වර්ගයේ වතුර මෝටර් 01 |
| 08 | AR 2486/23 | රෙඩ්මී වර්ගයේ ඩිස්ප්ලේ රහිත ජංගම දුරකථන 01 |
| 09 | AR 2484/23 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 10 | AR 2479/23 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 11 | AR 2480/23 | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 01 |
| 12 | AR 3872/23 | රොබින් වර්ගයේ වතුර මෝටර් 01 |
| 13 | AR 3870/23 | පරිගනක සීපීයූ යන්ත්‍රයක් |
| 14 | AR 3871/23 | ග්‍රිල් මැෂින් 01 |
| 15 | AR 1588/23 | ජංගම දුරකථන 03 |
| 16 | AR 2797/22 | පාපැදි 03 |
| 17 | 2697/24 | 1. ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 18 | 2696/24 | 1. ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 19 | 2695/24 | 1. ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 20 | 391/24 | 1.12.5kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 21 | 390/24 | 1.12.5kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 22 | 99125/24 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01<br>12.5kg ක් අඩංගු කහපාට ගෑස් සිලින්ඩරය |
| 23 | 92785/24 | 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 24 | 94545/24 | 1.12.5kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 25 | 88549/23 | 1.12.5kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01<br>2. ගෑස් ලිප් 01 |
| 26 | 90396/24 | 12.5kg ලාෆ් ගෑස් සිලින්ඩර් 01 |
| 27 | 59646/21 | වට හතරකින් යුත් ගෑස් ලිප් 01 |

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 28 | 3500/23 | 1.12.5kg ලාෆ් ගෑස් සිලින්ඩර් 01<br>2. වට තුනකින් යුත් ගෑස් ලිප් 01 |
| 29 | 57535/2 | 1.රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 02<br>2. 12.5kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01 |
| 30 | 74431/23 | 1.රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01<br>2. 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 31 | 77517/20 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 32 | 59930/21 | 1.රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01<br>2. 12.5kg ගෑස් සිලින්ඩර් 02 |
| 33 | 59694/21 | 1.ගෑස් ලිප් 01<br>2. ගෑස් සිලින්ඩර් 01 |
| 34 | 59820/21 | 1.රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01<br>2. 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 35 | 64600/22 | 12.5kg ගෑස් සිලින්ඩර් 01 |
| 36 | 57445/21 | 12.5kg ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් 01 |
| 37 | 57317/21 | 1.ගෑස් ලිප් 01<br>2. ගෑස් සිලින්ඩර් 01 |
| 38 | 59099/21 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් 01 |
| 39 | 56778/21 | 1.ගෑස් ලිප් 01<br>2. ගෑස් සිලින්ඩර් 01 |
| 40 | 59419/21 | ගෑස් ලිප් 01 |
| 41 | 56783/21 | 1.ගෑස් ලිප් 01<br>2. ගෑස් සිලින්ඩර් 01 |
| 42 | අංක රහිත | නිල් පාට ඩීඑස්අයි වර්ගයේ පාපැදි 01 |
| 43 | අංක රහිත | ප්‍රින්සස් ලෙස සඳහන් පාපැදි 01 |
| 44 | අංක රහිත | ලුමාලා වර්ගයේ පාපැදි 08 |
| 45 | අංක රහිත | කෙවියන් වර්ගයේ රතුපාට පාපැදි 01 |
| 46 | අංක රහිත | ඇක්සස් ලෙස සඳහන් රතුපාට පාපැදි 01 |
| 47 | අංක රහිත | අංක රහිත කළු පාට පාපැදි 04 |
| 48 | අංක රහිත | කාන්තා පාපැදි 04 |
| 49 | අංක රහිත | අබලන් වී දිරාපත් වී ඇති පාපැදි 10 |
| 50 | අංක රහිත | අංක රහිත අළු පැහැති පාපැදි 01 |

# රජයේ නොවන දැන්වීම්

**2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය යටතේ කෙරෙන ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 59(2) වගන්තියේ නියමයන් ප්‍රකාරව මෙයින් කෙරෙන ප්‍රසිද්ධ දැන්වීම නම් තුල්හිරිය, කුරුණෑගල පාර, MAS ෆැබ්රික් පාර්ක් (තැපැල් කේතය : 71610) හි ලියාපදිංචි ලිපිනය ඇති ටෙක්සො (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක පී.වී. 2614 දරන) හි ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් අට බිලියන නවසිය හැට දෙමිලියන තිස් හත් දහස් නවසිය හැත්තෑ හය (ලං. රු. 8,962,037,976) සිට ශ්‍රී ලංකා රුපියල් පස් බිලියන එකසිය විසි අට මිලියන හැත්තෑ අට දහස් නවසිය අසූව (ලං. රු. 5,128,078,980) දක්වා අඩු කරන ලද බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලෙය් අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්, ටෙක්සො (ප්‍රයිවට්) ලිමිටඩ්.

01 - 752

---

**ඒජේආර්ජේ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 130944)**

2007 අංක 7 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

ඒජේආර්ජේ හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් ("සමාගම") රුපියල් එක් දහස් හයසිය හැත්තෑ තුන් මිලියන එකසිය හතලිස් හතරදහස (රු. 1,673,144,000/-) සිට රුපියල් මිලියන එක් දහසක් (රු. 1,000,000,000) දක්වා ප්‍රකාශ කල ප්‍රාග්ධනය අවකරණය කොට එකී සමාගමේ ප්‍රකාශ කල ප්‍රාග්ධන ගිණුමෙන් රුපියල් හයසිය හැත්තෑ තුන් මිලියන එකසිය හතලිස් හතරදහස (රු. 673,144,000/-) හර කර එම මුදල කොටස් හිමියන්ට නැවත ලබා දීම මෙයින් දැනුම් දෙනු ලැබේ. සමාගමේ නිකුත් කල කොටස් එකසිය හැට හත් මිලියන තුන්සිය දාහතර දහස් හාරසිය (167,314,400) සිට මිලියන එකසිය (100,000,000) දක්වා අඩු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

2025 ජනවාරි මස 24 වැනි දින.

01 - 753

---

**නෙක්ෂියා කෝපරේට් කන්සල්ටන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්**

ඩයමන්ඩ් කටර්ස් ලිමිටඩ් සහ නිරු ලංකා එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 වගන්තියෙහි සඳහන් නියමයන්ට අනුව PB 856 අංකය දරන, අංක 20 - 24, මෝදරවිල ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්, පානදුර ලිපිනයෙහි ලියාපදිංචි කර ඇති ඩයමන්ඩ් කටර්ස් ලිමිටඩ් සහ PV 93694 අංක දරන අංක 25, මෝදරවිල ඉන්ඩ්‍රස්ට්‍රියල් එස්ටේට්, පානදුර ලිපිනයෙහි ලියාපදිංචි කර ඇති නිරු ලංකා එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම සමග ඒකාබද්ධ කිරීම සඳහා වූ යෝජනාවක් අනුමත වී ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩයමන්ඩ් කටර්ස් ලිමිටඩ් සහ නිරූ ලංකා එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම ඒකාබද්ධ කිරීම බලාත්මක වීමට නියමිත දිනය 2025 මාර්තු මස 10 වැනි දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකය නිකුත් කිරීමේ දිනය ලෙස සැලකෙනු ඇත. සමාගම් දෙකෙහිම අධ්‍යක්ෂක මණ්ඩලවල අදහස වී ඇත්තේ මෙම ඒකාබද්ධ කිරීම සමාගම් දෙකෙහිම යහපතට හේතුවන බවයි. සමාගම් ඒකාබද්ධ කිරීම බලාත්මක වූ වහාම මූල්‍ය ස්ථායිතාවය පිළිබඳ පරීක්ෂණයෙන් සමත්වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

සමාගමේ ඕනෑම කොටස් හිමියකුට හෝ ණය හිමියකුට ඒකාබද්ධ කිරීමේ යෝජනාව පරීක්ෂා කිරීමට හිමිකමක් ඇති අතර, එවන් කොටස් හිමියෙකු, ණය හිමියෙකු ඒකාබද්ධ කරනු ලබන සමාගම බැඳීමකට යටත් වී ඇති යම් තැනැත්තෙකුට එහි පිටපත් අංක 130, දෙවන මහල නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයෙහි පිහිටි සමාගම් ලේකම් වන නෙක්ෂියා කෝපරේට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් ඕනෑම වැඩ කරන දිනයක පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා කාලය තුළ ගෙවීමකින් තොරව ලබා ගත හැක.

අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝග මත,

නෙක්ෂියා කෝපරේට් කන්සල්ටන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් - සමාගම් ලේකම්.

ඩයමන්ඩ් කටර්ස් ලිමිටඩ් සහ නිරූ ලංකා එක්ස්පෝට්ස් (පුද්ගලික) සමාගම.

01 - 762

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.